# වන අලින්ට මුහුණ පෑමට සිදුව ඇති අර්බුද පිළිබඳව විමර්ශණාත්මක අධ්‍යනයක් (මින්නේරිය ජාතික වනෝද්‍යානය ඇසුරින්)

කේ.කේ.පී.කේ.එම්. සෙනරත් [1] එස්.ආර්.එල්. සේනානායක [2]

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත තුළ පිහිටා ඇති මින්නේරිය ජාතික වනෝද්‍යානය 1997 අගෝස්තු 12දී ජාතික උද්‍යානයක් වශයෙන් නම් කරන ලදි. මෙය 1938 දී වනජීවී අභය භූමියක් වශයෙන් ද ප්‍රකාශ කොට ඇත. මින්නේරිය වැව අවට ජල පෝෂක හා අවට ප්‍රදේශයේ වනජීවීන් ආරක්ෂා කර ගැනීමේ අරමුණු සහිතව ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කළ මෙම උද්‍යානය වියළි සමයේ පොළොන්නරුව, මාතලේ, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වාසය කරන අලි ගහණය සඳහා පෝෂක බිමක් ලෙස වඩාත් උපයෝගී වේ. එලෙස මින්නේරිය ජාතික වනෝද්‍යානය තුළ වෙසෙන වන අලින් හට මුහුණ දීමට සිදුවන අර්බුද මෙන්ම ඒවා වළකාලීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යනයේ පරමාර්ථය වේ. දත්ත රැස්කරගැනීමේ දී ක්ෂෙත්‍ර අධ්‍යනය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගන්නා ලදී. සංචාරක ආකර්ෂණය බහුල වශයෙන් හිමි වීමටත් මෙම වනෝද්‍යානය ආශ්‍රිතව වාසය කරන වන අලින් බොහෝ සෙයින් වැදගත් වේ. උද්‍යානය තුළ දී ඇතැම් අලි ඇතුන් මිනිසුන් සමඟ මුහුණට මුහුණ හමු වීමේ අවස්ථාවන්වල දී ඔවුන් වඩාත් ආක්‍රමණශීලී ලෙස හැසිරෙන බව නොරහසකි. දෛනිකව අලි ඇතුන් 150 - 200ක් අතර ප්‍රමාණයක් වැව් ආශ්‍රිතව රැස් වේ. වර්තමානය වන විට කුණු කසල බැහැර කිරීම්, ඉඩම් අත්පත් කර ගැනීම් මෙන්ම විවිධ දේශපාලන බල අධිකාරීන් යටතේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් හේතුවෙන් මෙම වනෝද්‍යාන ආශ්‍රිත වන අලින්ගේ ජීවන චක්‍රයට ඇතිව තිබෙන බලපෑම් හේතුවෙන් වන අලි මිය යෑම්, වන අලින්ගේ ශරීර දුර්වල වීම, වගා ලිං, හක්කපටස් හා දඩයක්කාර ක්‍රියාකාරකම්, ආහාර හිග වීම මඟින් දේපළ හානි මෙන්ම වගා හානි සිදු කිරීම් යනාදී ආක්‍රමණශීලී තත්ත්වයන් දක්වා පත්ව ඇත. 2016-2021 නවතම සංඛ්‍යා දත්ත අනුව ප්‍රදේශයේ වැව්පිටිවල ගැවසුන අලි ගහණය 289 සිට 20 දක්වා අඩු වී ඇත. මෙම තත්ත්වයන් වළක්වා ගැනීම උදෙසා ජාතික වනෝද්‍යානය තුළ සිදු කෙරෙන මානව ක්‍රියාකාරකම් නවතාලීම, වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත ක්‍රියාත්මක කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම, තේක්ක ටර්පන්ටයින් වැනි ශාක ඉවත් කර වාස භූමි පුළුල් කිරීම, වන අලින්ගේ දෛනික පැවැමට බාධා එල්ලවන සාධක අවම කිරීමත් ආදිය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් වන අලින් මුහුණපාන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් මුදවා ගැනීමටත් මිනිසාට එල්ලවන බලපෑම් වළක්වා ගැනීමටත් හැකි වනු ඇත.

**මුඛ්‍ය පද -** *අලි, බලපෑම්, වනෝද්‍යානය, මින්නේරිය, මිනිසුන්*

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධයයන අංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. kushanisenarath966@gmail.com

[2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධයයන අංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. randisenanayaka09@gmail.com